**සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය - 2016**

---------------------------------------------

සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස 6 සඳහා වූ වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 06 සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 24 දරන සුභසාධක ප්‍රතිලාභ පනතේ 18 (3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 මණ්ඩලය පිහිටුවීම

2016 පෙබරවාරි මස 02 වැනි දිනැති අංක 1952 / 22 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2002 අංක 24 දරන සුභසාධක ප්‍රතිලාභ පනත, 2016 පෙබරවාරි 15 දින සිට බලාත්මක කර තිබුණි. ඒ අනුව, පනතේ 03 ඡේදය ප්‍රකාරව, පනතේ කාර්යය සඳහා, පනත පරිපාලනය කිරීම සහ පනතින් මණ්ඩලය වෙත වෙන්කර දෙන්නා වූ හෝ පැවරෙන්නා වූ බලතල ක්‍රියාත්මක කිරීමේ කර්තව්‍ය ඉටු කිරීම භාර කෙරෙන සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය 2016 ජූලි මස ස්ථාපිතකර තිබුණි. තවද, පනතේ 4(අ) ප්‍රකාරව පාලක මණ්ඩලයේ සභාපතිවරයා ලෙස සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කොමසාරිස්වරයා පත්වන අතර අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන තවත් සාමාජිකයින් සිව්දෙනෙකුගෙන් පාලක මණ්ඩලය සමන්විත වී ඇත.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස 06 සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01

ප්‍රමිතය ප්‍රකාරව, කාලපරිච්ඡේදය තුල හඳුනාගත් සියළු ආදායම් හා වියදම් ඇතුලත් කර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයක් පිළියෙල කලයුතු වුවත් මණ්ඩලය විසින් වියදම් පමණක් ඇතුලත් කර වියදම් ප්‍රකාශනයක් පිළියෙල කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

ප්‍රමිතයේ 55 ඡේදය ප්‍රකාරව, වත්කමක් භාවිතා කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසු එම වත්කම් ක්ෂය කිරීම ආරම්භ කලයුතු වුවත් අමාත්‍යාංශය මගින් ලබාදී තිබූ පිරිවැය රු.3,773,670 ක්වූ වත්කම් ක්ෂය කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

සමාලෝචිත වර්ෂය තුළදී පුනරාවර්තන වියදම් සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් ලැබී තිබූ අග්‍රිමය වූ රු.899,051 ක් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර තිබූ අතර එම අග්‍රිමයෙන් දරන ලද පුනරාවර්තන වියදම ප්‍රාග්ධන වියදමක් ලෙස වත්කම්වලට එකතු කර දක්වා තිබුණි. ඒ හේතුවෙන් මුළු වත්කම් සහ මුළු වගකීම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

**2.3 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) 2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම දැක්වෙන වගකීම් ප්‍රකාශනයක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

2002 අංක 24 දරන සුභසාධක ප්‍රතිලාභ පනත ප්‍රකාරව ප්‍රතිලාභ ලබන්නන් හඳුනා ගැනීමට හැකිවන විනිවිද ස්වභාවයේ තේරීම් ක්‍රියාවලියක් ඇති කිරීම පිණිසද, එම ප්‍රතිලාභ අවසන් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට අනුශාංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවා තිබුණි. කෙසේ වුවද, ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා 2016 වර්ෂයට අදාළව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුව එහි පහත සඳහන් කාර්යයන් ඉටුකිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(අ) සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මූල්‍ය හා කළමනාකරණ කාර්යයන් ඉටුකිරීමට අදාළ මෙහෙයුම් අත්පොත පිළියෙල කිරීම.

සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය සඳහාම අනන්‍ය වූ "මෙහෙයුම් අත්පොතක්" සකස් කිරීමට සැළකිය යුතු කාලයක් ගතවන බැවින් 2016 දෙසැම්බර් 07 දින පවත්වන ලද සුභසාධක ප්‍රතිලාභ මණ්ඩල රැස්වීමේදී රජයේ ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි අත්පොත සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මූල්‍ය හා කළමනාකරණ කාර්යයන්වලදී මාර්ගෝපදේශකයක් ලෙස භාවිතා කිරීමට තීරණය කරන ලද බව සභාපතිවරයා විසින් විගණනයට දන්වා තිබුණි.

(ආ) සුභසාධක ප්‍රතිලාභ ලැබීමට සුදුස්සන් හඳුනා ගැනීමට හැකිවන ආකාරයේ යෝග්‍ය නිර්නායක සහිත විනිවිද ස්වභාවයේ තේරීම් ක්‍රියාවලියක් ඇති කිරීම පිණිස සුභසාධක ප්‍රතිලාභ පරිපාටියක් (Welfare Benefit Scheme) සකස් කිරීම සඳහා පවත්නා සුභසාධක ක්‍රමයන්හි කාර්යක්ෂමතාව පිළිබඳ සමීක්ෂණයකට ලක්කර එහි දුර්වලතා හඳුනාගෙන ඒ පිළිබඳ උපායමාර්ගික පත්‍රිකාවක් පිළියෙල කිරීම.

-----------------------------------------------------------------------------------------------

සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සහ සමාජ අරක්ෂණ ජාල ව්‍යාපෘතියේ නිළධාරීන් විසින් කුඩා නියැදි පදනමක් මත පවත්නා සුභසාධක ක්‍රමයන්හි කාර්යක්ෂමතාව පිළිබඳව සමීක්ෂණය කිරීමට මුලිකවම කටයුතු කළ අතර, පසුව එය වඩා පුළුල් නියැදි පදනමක් මත ලෝක බැංකුව විසින්ම සිය වියදමෙන් සිදු කළ යුතු කාර්යයක් බවට පරිවර්තනය වී එම කාර්යය ලෝක බැංකුව විසින් ප්‍රයිස් වෝටර් කූපර් (PwC) ආයතනයට භාර දෙන ලද බව සභාපතිවරයා විසින් විගණනයට දන්වා එවා තිබුණි.

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

**-------------------------------**

2016 පෙබරවාරි 02 දිනැති අංක 1952/22 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2002 අංක 24 දරන සුභසාධක ප්‍රතිලාභ පනත, 2016 පෙබරවාරි 15 දින සිට ක්‍රියාත්මක විය යුතු බව දක්වා තිබුණි. ඒ අනුව, එම පනත ක්‍රියාත්මක කිරීම සඳහා 2016 ජූලි මස සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය ස්ථාපිත කර 2016 වසර සඳහා මණ්ඩලයේ පුනරාවර්තන වියදම් සඳහා රු. 6,850,560 ක් හා ප්‍රාග්ධන වියදම් සඳහා රු. 400,000 ක් වශයෙන් මුලු එකතුව රු. 7,250,560 ක් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ පරිපූරක ප්‍රතිපාදන සලසාගෙන තිබූ නමුත් පුනරාවර්තන වියදම් සඳහා රු. 899,051 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මණ්ඩලය තාවකාලික පදනම මත අමාත්‍යාංශය තුළ ස්ථාපිත කිරීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වූ බව මණ්ඩලය විසින් දන්වා තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**----------------------------------------**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**---------------------------------**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මණ්ඩලය විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ අවුරුදු 01 යි මාස 08 ක් ප්‍රමාදවීමෙන් පසු 2018 නොවැම්බර් 09 දිනදීය.